අඝාතය පිළිබඳ ජගත් අයිතිවාසිකම් කෙටුම්පත

[www.word-stroke.org](http://www.word-stroke.org)



ලොව වෙසෙන සෑම පුද්ගලයින් **06** දෙනෙකුගෙන් එක් **01** අයෙකුට එනම් **වසරකට මිලියන 17කට** අඝාතය වැළදීමට ඉඩ තිබේ. ඒ අතුරින් **මිලියන 06කට** සිය ජීවිත අහිමි විය හැක.

මේ ඉලක්කය පිටුපස තිබෙන්නේ සැබෑ මිනිස් ජීවිතයි'

## අඝාතය වැළඳුන පුද්ගලයෙකු වශයෙන් මා හට,



හොඳම ප්‍රතිකාර ලබා ගැනීමට



ඒ පිළිබඳ දැනුවත් වීම තුලින් පෙර සුදානම් වීමට



සුවය ලබා ගැනීම සඳහා සහාය ලබා ගැනීමට අයිතියක් ඇත.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා [www.word-stroke.org](http://www.word-stroke.org) වෙබ් අඩවියට පිවිසෙන්න.

# අඝාතය පිළිබඳ ජගත් අයිතිවාසිකම් පනත

## අඝාතය වැළඳුන පුද්ගලයෙකු වශයෙන් මා සතු අයිතිවාසිකම්

### <u>හොඳම ප්‍රතිකාර ලබා ගැනීම</u>



- ඉක්මන් රෝග විනිශ්චය මගින් ඉක්මන් ප්‍රතිකාර ලබා ගැනීමට
- රෝහල් ගත වීමේ සිට පුනරුත්තාපනය දක්වා විශේෂඥ කණ්ඩායමක් මඟින් ප්‍රතිකාර ලබා ගැනීමට.
- මනා සම්බන්ධීකරණයකින් යුතුව රැක බලාගනු ලැබීම
- ප්‍රතිකාර ලබා ගැනීමේදී, මගේ ආර්ථික පසුබිම, ස්ත්‍රී පුරුෂභාවය, සමාජ සංස්කෘතික පසුබිම හෝ මා ජිවත් වෙන පරිසරය යන කරුණු මත බලපෑමක් නොවීම.
- ප්‍රතිකාර ලබා ගැනීමේදී, වයස, ස්ත්‍රී පුරුෂභාවය ,සමාජ සංස්කෘතික පසු බිම, අරමුණු සහ කාලීන අවශ්‍යතා යන කරුණු පිළිබඳ අවධානය යොමු වීම.

### <u>දැනුවත් කරනු ලැබීම මගින් රෝගය සඳහා සුදානම් වීම</u>



- අඝාත රෝග ලක්ෂණ පිළිබඳව දැනුවතව සිටීම මගින් රෝගය වැළඳී තිබේ නම් එය හඳුනාගත හැකිවීම.
- මගේ රෝගී තත්වය පිළිබඳව සියළු කරුණු දැන ගැනිමෙන් එම තත්වය සමඟ ජිවත් වීමට හැකියාව ලැබීමට.

### <u>සුවය ලබා ගැනීම සඳහා සහාය ලබා ගැනීම.</u>



- රෝගය සුව වීමේදී ලබා ගත හැකි හොඳම නිරෝගී තත්වය පිළිබඳ බලාපොරොත්තු ඇති කර ගැනීම
- මාගේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි මානසික හා චිත්තවේගී රැකවරණය ලබා දීම
- මාගේ අබාධිත බව ගැන නොතකා ඕනෑම සමාජ තත්වයකට ඇතුලත් වීම
- දිගු කාලීන රැකවරණය සඳහා මුදල් හෝ වෙනත් ආකාරයක උපකාර ලබා ගැනීමට.
- ආඝාත තත්වයෙන් පසු මාගේ කැමැත්ත පරිදි නැවත රැකියාවට හෝ /හා වෙනත් කටයුතු වලට සහභාගී වීමට උදව් දීමට.

- මට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට විධිමත් හෝ අවිධිමත් අකාරයේ පිවිසුමත් ලබා දීම.
- අනෙකුත් ආඝාත වැලඳී ජිවත් වන්නන් සහ ඔවුන්ගේ රැකබලාගන්නන් සම්බන්ධ කර දීම තුලින් මාගේ සුව වීමට උදව් කිරීම.

අඝාතය යනු සංවර්ධිත හා සංවර්ධන වෙමින් පවතින රටවල පුද්ගලයින් මිය යාමට හා ආබාධිත තත්වයට පත් වීමට බලපාන ප්‍රධාන හේතුවකි.

වසරකට මිලියන 17කට වැඩි පිරිසකට ආඝාතය වැළදෙන අතර ඉන් මිලියන 6කට පිවිතය අහිමි වේ. වයස හෝ ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව සෑම තත්පර 2කට වරක් පුද්ගලයකුට අඝාතය වැලදේ.

**මෙම ඉලක්කම් කිරීම පිටුපස තිබෙන්නනේ සැබෑ මිනිස් ජිවිතයි.**

සිත කම්පනයට පත්වන අකාරයේ මෙවැනි දත්ත අසන්නට ලැබුනද, ආඝාතය වැලඳුන බොහෝ පිරිසකට ප්‍රතිකාර, පුනරුත්තාපනය සහ රැකවරණය ලබා ගැනීමට නොහැකි වීම නිසා මනා සුවයක් සෞඛ්‍යමත් එලදායි ස්වාධින ජිවිතයක් ගත කිරීමේ මහඟු ඉඩකඩ අහිමි වී ඇත.

ලෝක ව්‍යාප්ත අඝාත රෝගීන්ගේ අයිතිවාසිකම් පනත, ලෝක අඝාත රෝගීන්ගේ වැදගත් ප්‍රමුඛතාවකි.මෙම පනත මගින් ලොව පුරා සිටින සියළු ආඝාත රෝගින් සහ ඔවුන් රැකබලාගන්නන් සඳහා වැදගත් වන සියළු පැතිකඩවල් හදුනා ගෙන තිබේ.

මෙම පනත තනි පුද්ගලයන් ලෙස හෝ සංවිධාන ලෙස ආඝාත රෝගීන් සඳහා රැකවරණය ලබා දෙන්නන් සමඟද , රජයන් සහ අනෙකුත් ආයතන සමඟද, ආඝාතය වැළඳුන රෝගියකු සුවය ලබා දීම සඳහා වඩා වැදගත් යැයි සිතන කරුණු පිළිබඳව සන්නිවේදනය කිරීමට මෙවලමක් ලෙස භාවිතා කල හැත.මෙම පනතට ඇතුලත්ව ඇති, ආඝාත රෝගීන්ට සුවය ලබා ගැනීම සඳහා ඉවහල් වේ යැයි සිතන කරුණු ඔවුන්ගේ අබාධිත තත්වය හා මරණ සංඛ්‍යාව අඩු කරන බව පෙන්වා දී ඇත.

ලෝක ව්‍යාප්ත ආඝාත රෝගින්ගේ අයිතිවාසිකම් පනත නිතිමය ලියවිල්ලක් නොවේ. මේ ආඝාතය වැළඳී ජිවත් වන්නන්ට හා ඔවුන් රැක බලා ගන්නට ඒ පිළිබඳ හොදම ප්‍රතිඵල හා අත් දැකීම් ලබා ගැනීමට උපකාරී වන ඒ පිළිබඳ මුලික කරුණු අඩංගු මාර්ගෝපදේශකයකි.

ලෝකයේ ඒ ඒ කලාප වල ආඝාතය වැළඳී සුවය ලැබු කණ්ඩායමක් හා ඔවුන් රැකබලා ගන්නන් විසින් මෙම පනත සකස් කරන ලදී. මෙම පනත සැදීමට ආඝාතය වැළඳී ජිවත් වන්නන් හා ඔවුන් රැක බලා ගන්නන් විශාල ප්‍රමාණයක්ද ලෝකයේ විවිධ කෙටස් වල වෙනසක් ඇති යැයි සමීක්ෂණය කල දහස් ගණනක් විවිධ රටවල විවිධ සංස්කෘතින්ට අයත් විවිධ භාෂා කාථා කරන සමීක්ෂකයින්ද උදව්

කර ඇත.ඔවුන්ගේ ප්‍රතිචාර පෙන්නුම් කලේ ආඝාතයයෙන් සුවය ලැබීමට හේතු වේ යැයි සැලකූ කරුණු ලෝකයේ කුමන ස්ථානයක් සිටියත් වෙනස් නොවන බවය.

ලෝක ව්‍යාප්ත ආඝාත රෝගින්ගේ පනතේ අඝාතය වැලදී ජිවත් වන්නන් හා ඔවුන් රැක බලා ගන්නන් වැදගත් යැයි අනුපිළිවෙලට සඳහන් කල අදහස් ඒ පිළිවෙලටම දක්වා ඇත.

මේ පනත දීප ව්‍යාප්ත ආඝාත රෝගීන්ට රැකවරණය ලබා ගැනීමේ ප්‍රවේශ වැඩි දියුණු කිරීමට වැදගත් වන මෙවලමක් වේ යැයි අපි බලාපොරෝත්තු වෙමු.